**ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගම - 2023**
**---------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියෙහි 17 හි 19 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 90,853,735 ක් වූ ජංගම නොවන වත්කම් අයිතම 1,109 ක් සමාගම විසින් අඛණ්ඩව භාවිතයට ගෙන තිබුණද මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ වටිනාකම ඉදිරිපත් කිරීම සඳහා වත්කම්වල ඵලදායි ජීවිත කාලය හා සුන්බුන් වටිනාකම නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් ප්‍රමිතියට අනුව අදාළ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කලයුතු බැවින් ඒ සඳහා වන පිරිවැය, කාලය හා වත්කම් ප්‍රත්‍යාගණනයෙන් ආයතනයට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ සලකා බලා මෙම කාර්ය සිදු කර නොමැත. එමෙන්ම වත්කමෙහි ධාරණ අගය හා සාධාරණ අගය අතර ප්‍රමාණාත්මක වෙනසක් නොපවතින බවට උපකල්පනය කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම්වල සාධාරණ වටිනාකම දැක්විය යුතුය. |
| (ආ) | මනම්පිටිය වැලි ව්‍යාපෘතියේ රාජ්‍යභාග හා බලපත්‍ර ගාස්තු වියදම රු.86,352,396 ක් වුවද එම වියදම රු.78,072,349 ක් ලෙස රු.8,280,047 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම නිසා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එයට හේතුව 2022 වර්ෂයට අදාලව අප විසින් වෙන් කර ඇති අධිවෙන් කිරීම ගැලපීමයි. | කැණීම් කරන ලද ප්‍රමාණය පදනම් කරගෙන නිවැරදිව රාජ්‍යභාග ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2022 ජුලි 10 දින සිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවති කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට වැලි තොගයක් නොමැති වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.10,603,916 ක වැලි තොග වටිනාකමක් දක්වා තිබුණි. ඒ හේතුවෙන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම තොග ඌණතාවය සම්බන්ධයෙන් මේ දක්වා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතිය පිළිබඳව කමිටුවක් මඟින් විශේෂ විමර්ශනයක් සිදු කර ඇත. එම විමර්ශන වාර්තාව සභාපතිතුමා, ප්‍රධාන විධායක නිළධාරීතුමා, විගණන හා කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයට හා පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර එමඟින් ලැබෙන නිර්දේශ හා උපදෙස් මත පදනම්ව ඉදිරියේ දී තොග ඌණතාවයන් සම්බන්ධව ගැලපීම් සිදු කිරීමට සහ ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. | තොග භෞතික සත්‍යාපනයක් සිදුකර නිරවද්‍යතාවය තහවුරු කර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කළ යුතු අතර තොග ඌණතාවය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් සමාගමට ලැබිය යුතු ශේෂය රු.6,679,175 ක් ලෙස දක්වා තිබුණද කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන | රාජ්‍ය භාගය ලෙස වැඩිපුර ගෙවා ඇති වැලි කියුබ් ගණනට අදාලව අප වෙත ලැබිය යුතු ශේෂය මෙහි දක්වා ඇත. එය කාර්යාංශය විසින් ඉදිරි ගෙවීම් වලදී හිලව් කිරීමට එකඟ වී ඇති අතර කාර්යාංශය විසින් | ආයතන 2 හි ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුව කාර්යාංශය විසින් සමාගමට ගෙවිය යුතු ශේෂයක් දක්වා නොතිබුණි. | තහවුරු කරන ලද ලේඛන මත පදනම්ව මෙම ගැලපීම සිදු කර ඇත. | |
| (ආ) | සේවය අවසන් කර තිබූ සේවකයන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.114,579 ක් වූ ආපදා ණය වාරික හා පොලී අයකර ගැනීමට මෙම වාර්තාවේ දින වන විටද කටයුතු කර නොතිබුණි. | රු.94,844 ක ණය මුදල අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇත. ණය මුදල් හිලව් කර ගැනීම සඳහා පාරිතෝෂික මුදල් ප්‍රමාණවත් වේ. | ලැබිය යුතු ණය හා පොලී අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | රු.31,367,131 ක් වූ වෙළඳ ලැබිය යුතු ශේෂ තුළ වර්ෂ 10 කට වැඩි කාලයක් තිස්සේ පවතින එකතුව රු.4,136,387 ක් වූ ශේෂ 86 ක් වූ අතර වර්ෂ 5-10 අතර කාලයක සිට පවතින එකතුව රු.6,837,177 ක් වූ ශේෂ 78 ක් විය. මෙම ශේෂ අයකර ගැනීමට මෙම වාර්තාවේ දින වන විටද කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ 2024 මූල්‍ය වර්ෂයේදී නිරවුල් කරගැනීමට කටයුතු කරනු ලබන අතර පෙර වර්ෂ වලට සාපේක්ෂව ශේෂ කිහිපයක් 2023 මූල්‍ය වර්ෂය තුළදී නිරවුල් වී ඇත. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට නොපමාව අවශ්‍ය පියවර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගම විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට ගෙවිය යුතු ශේෂය රු.1,487,602 ක් වූ අතර එම කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල සමාගමෙන් ලැබිය යුතු ශේෂය ලෙස රු.26,928,891 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.1,487,602 ක වටිනාකම මනම්පිටිය ව්‍යාපෘතියට අදාලව නොවැම්බර් සහ දෙසැම්බර් මාසය සඳහා ගෙවීමට ඇති ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව වන අතර කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.26,928,891 ක මුදලක් අප විසින් කාර්යාංශය වෙත ගෙවීමට නොමැත. | ආයතන 2 හි ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017-2023 කාලය තුළ විවිධ ව්‍යාපෘති සේවා ලබා ගැනීම සඳහා ආයතන හා පුද්ගලයන් 149 ක් විසින් එකතුව රු.9,688,220 ක් වූ අත්තිකාරම් සමාගම වෙත ගෙවා තිබුණු අතර ඒ තුළ වසර 5 ඉක්මවූ රු.3,000,636 ක් වූ අත්තිකාරම් ශේෂ 47ක් විය. මෙම අත්තිකාරම් මෙම වාර්තාවේ දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | 2024.01.11 පැවති No.GSMBTS/185/15 අංක දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් එම අත්තිකාරම් මුදල් ආදායම් ලෙස ගැනීමට අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල විසින් නැවත විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදි. | අත්තිකාරම් පරීක්ෂා කර සේවා සැපයුම් සිදුකළ යුතු නම් ඒ සඳහා ද, සේවා සැපයුම් සිදුකළ යුතු නොවේ නම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | ආගණනය කරනු ලැබූ පාරිතෝෂිකයන් සේවය අවසන් කිරීමේ දින සිට දින 30 ක කාලයක් ඇතුළත ගෙවිය යුතු වුවත් 2023 ජනවාරි 31 දින සේවය අවසන් කළ හු විද්‍යාඥයෙකුට ගෙවිය යුතු රු.146,690 ක් වූ පාරිතෝෂික මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවා නොතිබුණි. | පාරිතෝෂික මුදල ගෙවීම සඳහා ගිණුම් අංශය වෙත යොමු කර ඇත. මින් ඉදිරියේදී පාරිතෝෂික ගෙවීම් පනත අනුව දින 30 ඇතුළත පාරිතෝෂික මුදල ලබා දීමට කටයුතු කරන බව දන්වමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික සේවය අවසන් කිරීමේ දින සිට දින 30 ක කාලයක් ඇතුළත ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 සැප්තැම්බර් 27 දිනැති 01/2021(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8 ඡේදය | (i) චක්‍රලේඛ ප්‍රකාරව පරිපාලිත සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා කොන්ත්‍රාත් පදනම මත පත්කළ යුතු වුවත් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා 2023 සැප්තැම්බර් 15 දින සිට ස්ථිර පදනම මත පත්කර තිබුණි. | ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා පත් කර ඇත්තේ පරිසර අමාත්‍යවරයා විසිනි. ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර ස්ථිර පදනම මත අන්තර්ග්‍රහණය කරන තනතුරු 35 අතර වන බැවින් ආයතනයේ සහ මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ස්ථිර පදනමේ පිහිටුවා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා පත්කළ යුතුය. |
| | | (ii) සමාගම මව් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ පරිපාලන හා මූල්‍ය අත්පොතක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව පිළියෙල කළ යුතු වුවත් මේ දක්වා පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | පරිපාලන හා මූල්‍ය අත්පොත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | 2022 ඔක්තෝබර් 06 දිනැති අංක 06/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වයස අවුරුදු 63 ක නිලධාරියෙකු සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස 2023 සැප්තැම්බර් 01 වන දින කොන්ත්රාත් පදනම මත බඳවා ගෙන 2023 ඔක්තෝබර් 23 වන දින ස්ථිර කර තිබුණි. | ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා පත් කර ඇත්තේ පරිසර අමාත්‍යවරයා විසිනි.<br>ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර ස්ථිර පදනම මත අන්තර්ග්‍රහණය කරන තනතුරු 35 අතර වන බැවින් ආයතනයේ සහ මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ස්ථිර පදනමේ පිහිටුවා ඇත. | වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් බඳවා නොගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.159,733,997 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.97,081,603 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.62,652,394 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ව්‍යාපෘතිවලින් ලද ආදායම රු.10,536,583 කින් අඩු වුවද අනෙකුත් මෙහෙයුම් නොවන ආදායම රු.47,918,464 කින් වැඩිවීම හා පරිපාලන වියදම් රු.20,313,497 කින් වැඩි වුවද ව්‍යාපෘති වියදම් රු.45,415,698 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සූරියපුර ග්‍රාම නිලධාරී වසමේ මහවැලි ගඟේ ආරක්ෂණ වේල්ලට තර්ජනයක් වන වැලි කැණීම හා ගං ඉවුර සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ තැන්පත් වී ඇති කියුබ් 103,128 ක් වූ වැලි නිධිය ඉවත් කිරීමට 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සමාගම වෙත පවරා ඇතත් 2022 ජුලි 10 වන දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු වැලි කැණීම් කටයුත්තක් සිදුනොකර රු.4,773,910 ක වැටුප්, දීමනා, ගෙවල් කුලී, කාර්යාල වියදම්, ගමන් වියදම් යනාදී වියදම් දරා තිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය යටතේ රු.168,254,363 ක ඇස්තමේන්තුවකට මහවැලි ගඟේ බාදන වාරක 03ක් ඉදිකිරීමට සමාගම සැලසුම් කර ඇතත් එක් බාදන වාරකයක් පමණක් ඉදිකර අවසන් කර තිබූ අතර ඉතිරි බාදන වාරක 02 හි ඉදිකිරීම් ප්‍රගතිය පිළිවෙලින් සියයට 75 හා 54 ක් විය. මෙම බාදන වාරක ඉදිකිරීම්වල ගිවිසුම් කාලය මේ වන විට ඉක්මවා ඇති අතර, බාදන වාරක 02 හි වැඩ අවසන් කර නොමැති බැවින් ගංවතුර තත්ත්වයන් වලදී මහවැලි ගඟේ වේල්ලට හානි සිදුවිය හැකි බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ආයතනවලින් මෙම ව්‍යාපෘතියට අවශ්‍ය අවසරයන් ලැබීමට ප්‍රමාද වීම නිසා බලපත්‍ර ලබා ගැනීම ප්‍රමාද වීමත්, වෙතත් ඉඩම් පරිහරණය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් අවසරය ලබා නොදීම හේතුවෙන් වැලි කැණීම සඳහා ඉල්ලුම් කළ වැලි ප්‍රමාණයන්ගෙන් සියයට 53.6 පමණක් කැණීම් කිරීම සිදු කර ඇති අතර, බාදන වාරක ඉදිකිරීම සියයට 75 පමණ නිමකර ඇත. මෙහි ඉදිරි කටයුතු ද නිමකර මෙම ව්‍යාපෘතිය අවසන් කරලීම වෙනුවෙන් ආයතනය කටයුතු කරන ලද අතර, ඊට අවශ්‍යය රාජ්‍ය ආයතනවල අවසරය ලැබුණු පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවේ. | ව්‍යාපෘතිය නිසි සැලසුම්කරණයකින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර ගංවතුර තත්ත්වයකදී වේල්ලට සිදුවිය හැකි හානි සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ආ) | සමාගම ක්‍රියාත්මක කර තිබුණු මූතූර් වැලි ව්‍යාපෘතියේ කැණීම් කටයුතු 2022 අප්‍රේල් මස සිට නතර කර තිබුණු අතර කිසිදු වැලි කැණීම් කටයුත්තක් සිදු නොකර සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.1,569,372 ක වැටුප්, දීමනා, ඉන්ධන, විදුලිය, ගෙවල් කුලී යනාදී වියදම් දරා තිබුණි. | මූතූර් වැලි කැණීම් ව්‍යාපෘතියේ සිදුවී ඇති අක්‍රමිකතා පිළිබඳව ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අභ්‍යන්තර විගණන අංශය, පරිසර අමාත්‍යාංශය මඟින් පරීක්ෂණ සිදුකරනු ලබයි. එම පරීක්ෂණවල ප්‍රතිඵල අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය. | ව්‍යාපෘතිය නිසි සැලසුම්කරණයකින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2017 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කළ කොටිකම්බොක්ක තිරුවානා නිධිය කැණීමේ ව්‍යාපෘතියේ කටයුතු මෙම වාර්තාවේ දින වන විටත් ආරම්භ කර නොතිබුණු අතර රු.24,823,325 ක වියදම් දරා තිබුණි. එම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට පෙර 2017 වර්ෂයේදී රු. මිලියන 2.2 කට මිලදී ගන්නා ලද පාලම් තරාදිය (Weigh bridge) නිෂ්කාර්ය වත්කමක් බවට පත්ව තිබූ අතර 2019 වර්ෂයේදී තරාදිය ක්‍රමාංකනය කිරීම සඳහා එහි විද්‍යුත් උපාංග තරාදිය මිලදී ගත් සමාගම විසින් ඉවත් කරගෙන නැවත සමාගම වෙත ලබාදී නොතිබුණි. | ව්‍යාපෘතිය හා සම්බන්ධ වන ආයතන සමග කටයුතු කරමින් කැණීම් බලපත්‍ර සම්බන්ධව කටයුතු ආරම්භ කර ඇති අතර, 2023.10.13 දින කැණීම් බලපත්‍රය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ඉල්ලුම් කර ඇත. | ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කර පාලම් තරාදියෙහි විද්‍යුත් උපාංග තරාදිය නැවත ලබා ගත යුතුය. |
| (ඈ) | මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතිය සතු රු.8,883,520 ක් වටිනා ලෝඩර් යන්ත්‍රය 2017 ජුලි 16 දින සිට අක්‍රියව තිබුණු අතර යන්ත්‍රය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023/10/23 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම ලෝඩර් රථය නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් ඔස්සේ අලුත්වැඩියා කිරීමට හෝ අලෙවි කිරීමට සුදුසු බව නිර්දේශ කරන ලදී.ඒ අනුව 2024/03/26 වන ලෝඩර් රථයෙහි වර්තමාන වෙළඳපොල මිල සම්බන්ධ තක්සේරුවක් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. එම දෙපාර්තමේන්තුව 2024/04/05 වන දින දුරකථන මාර්ගය ඔස්සේ දන්වා සිටියේ මේ සඳහා ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය දැනුවත් කොට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලබන බවය. | යන්ත්‍රය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | පිරිවැය රු.104,650 ක් හා රු.567,000 ක් වූ මෝටර් සයිකලයක් හා බහළුමක් 2014 වර්ෂයේ සිට අස්ථානගතවී ඇති බවට සමාගම හඳුනාගෙන තිබුණද ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අස්ථානගත වී ඇතැයි වාර්තා වී ඇති මෝටර් බයිසිකලය සහ බහලූම සම්බන්ධයෙන් අධ්‍යයනය කර වාර්තාවක් සැපයීමට අභ්‍යන්තර කමිටුවක් පත් කර ඇති අතර අදාළ කමිටුව විසින් ලබා දෙන අවසන් වාර්තාව කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කර අවශ්‍ය කඩිනම් ඉදිරි ක්‍රියා මාර්ග ගනු ලබන බව දන්වමි. | වත්කම් අස්ථානගත වීමට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජවක රක්ෂිතය තුල පවතින කැල්සයිට් නිධිය කැණීම් කර අගය එකතුකර අපනයනය කිරීමත්, දේශීය වශයෙන් භාවිත කිරීමත් අරමුණු කරගෙන ව්‍යාපෘතියක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ එක්ව සිදුකිරීම සඳහා 2020 වර්ෂයේ සිට සැලසුම් | ප්‍රායෝගික ගැටලු සහගතභාවය නිසා එම ව්‍යාපෘතිය වෙනුවෙන් මුදල් වැය කිරීම සම්පූර්ණයෙන්ම නවතා දමා ඇති අතර, එම ව්‍යාපෘතියේ නිෂ්කාර්ය වියදම් පිළිබඳව සොයා බැලීමට කමිටුවක් පත් කර ඇත. එම කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. | ව්‍යාපෘතිය නිසි අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය ආරම්භ කිරීම හා එම කටයුතු කළ නිලධාරීන් පිළිබඳ පරීක්ෂණය සිදුකර ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට උපදේශන සේවා ගාස්තු ගෙවීම, ප්‍රවාහන, ගමන් වියදම්, සංයුක්ත දීමනා පරීක්ෂණ ගාස්තු යනාදී සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට සමාගම රු.3,304,612 ක වියදම් දරා තිබුණු අතර මෙම ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | | |
| (ආ) | කන්තලේ සිරිමංගලපුර වැලි විකුණුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා 2023 ජූනි මස සිට සේවකයන් 06 දෙනෙකු අනුයුක්ත කර වැටුප් හා වේතන, ඉන්ධන, ගෙවල් කුලී, සුභසාධක, විදුලිය යනාදිය සඳහා රු.1,764,297ක වියදම් දරා තිබුණද ව්‍යාපෘතිය නවතා දැමීමට 2024 ජනවාරි මස තීරණය කර තිබීම හේතුවෙන් දරන ලද වියදම් නිෂ්කාර්ය වී තිබුණි. | කන්තලේ ව්‍යාපෘතිය විෂයභාර ඇමතිතුමා විසින් ලබාදුන් උපදෙස් අනුව කටයුතු කිරීමට 2023/05/29 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදි සාකච්ඡාවට ගෙන 2023/07/01 දින සිට මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට උපදෙස් ලබාදී ඇත. අදාළ රාජ්‍ය ආයතනය ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය නිතීමය පසුබිම සකස් කර දීම ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වීම පිළිබඳව 2024/01/26 දිනැති අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතියේ කටයුතු නවතා දැමීමට අධ්‍යක්ෂක මණ්ඩලය උපදෙස් ලබාදී ඇත . | නිසි අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාගමේ අලෙවිකරණ සහ සැලසුම් කළමනාකරු තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා 2023 සැප්තැම්බර් 19 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබුණි. එසේ වුවද උක්ත තනතුර සඳහා විගණිත දින වූ 2024 පෙබරවාරි 08 වන විටත් බඳවා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. මේ අනුව මෙම තනතුරෙහි සැලසුම් කළමණාකරණ තනතුර ලෙස අනුමත කාර්ය මණ්ඩලයෙහි ඇතුළත් නොවූ තනතුරක් ඇති කර ඒ වන විට සිටි නිලධාරිනියක 2023 ඔක්තෝබර් 09 දින ස්ථිර පදනම මත පත්කර තිබූ අතර එකී පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. | සම්මුඛ පරීක්ෂණ පවත්වන අවස්ථාව වන විට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි ආයතනයේ බඳවාගැනීමේ පටිපාටියේ සංශෝධන සිදු කරමින් පැවති අතර ආයතනයේ අවශ්‍යතාව පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේද එකඟත්වය මත සංශෝධිත ලකුණු සටහන සම්මුඛ පරීක්ෂණය සඳහා භාවිත කර ඇත.<br>ආයතනයේ පිරිවැය කළමනාකරණ කාර්යය පදනම් කරගනිමින් නැවත අලෙවිකරණ කළමනාකාර තනතුර සඳහා පත්වීමක් ලබාදීම අවශ්‍ය නොවන අතර දැනට ආයතනයේ සැලසුම් කාර්යයභාරයට අදාළ රාජකාරි සැලසුම්/ සම්බන්ධීකරණ කළමනාකරු විසින් සිදු කරන අතර අලෙවිකරණ අංශයේ අනෙකුත් කටයුතු තාක්ෂණික අධ්‍යක්ෂක විසින් අධීක්ෂණය කරනු ලබයි. | අනුමත කාර්ය මණ්ඩලයෙහි නොවූ තනතුරු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පත් කිරීම් සිදු නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගම 2023 ඔක්තෝබර් 09 දින සිට බලපැවැත්වෙන පරිදි 35 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් ස්ථිර කිරීමේදී සියළුම අභ්‍යන්තර සේවකයින් වෙතින් අයදුම්පත්‍ර ලබා නොගෙන,සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඒවා ඇගයීමට ලක්කර නොකර,ඒ සඳහා 2008, 2012 හා 2013 වර්ෂවල කොන්ත්‍රාත් පදනමට බඳවා ගත් සුදුසුකම් සහිත සේවකයින්ඇතුළත් නොකර ස්ථිර නොකර ඊට පසු වර්ෂවල කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන්ඇතුළත් කිරීම හා කාර්යසාධන ඇගයීම් ක්‍රියාපරිපාටිය නිසි අයුරින් සිදුකර ඇති බවත් සම්මුඛ පරීක්ෂණ වලට භාජනය කර තෝරා ගත් බවත් සඳහන් කර 2023 සැප්තැම්බර් 21 දින පැවති 182 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන සම්මුඛ පරීක්ෂණ නොපවත්වා ස්ථිර කර තිබුණි. | ආයතනය සඳහා ස්ථිර පදනමින් බඳවා ගත යුතුයයි හඳුනාගත් තනතුරු 39 ක් සඳහා ආයතනයේ සහ පරිපාලිත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිවී ඇත. ඒ අනුව එම තනතුරු වල කොන්ත්‍රාත් පදනමින් ඒ වන විට සේවය කළ සේවකයින් කාර්යය සාධන ඇගයීමට ලක්කර අදාළ තනතුරු 35 ක් සඳහා අන්තර්ග්‍රහණය කර ඇත. | සේවකයන් ස්ථිර කිරීමේදී අධ්‍යාපනික සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳව පරීක්ෂා කර නිසි ක්‍රමවේදයට අනුව ස්ථිර කිරීම හා සාවද්‍ය තොරතුරු සැපයූ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |

**04. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලසුමට සමාගමේ මානව සම්පත් අංශය, අලෙවි අංශය සහ සැලසුම් අංශය යන අංශවල කාර්යභාරයන් ඇතුලත් කර නොතිබුණි. | ඉදිරියේ දී ඉහත සඳහන් අංශයන් සඳහා අදාළ කාර්යභාර්යන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත. | ආයතනයේ සියලුම අංශවල දායකත්වය ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සමාගම වැලි විකුණුම් වලින් රු.2,417,000,000 ක හා කැණීම් හා භූ විද්‍යාත්මක ව්‍යාපෘති වලින් රු.159,000,000 ක ආදායම් උපයා ගැනීමට ඉලක්ක කර තිබුණද උපයාගෙන තිබුණේ පිළිවෙලින් රු.27,316,991 ක් හා රු.62,797,518 ක් වූ සියයට 1.1 ක හා සියයට 39.5 ක ආදායම් පමණි. සමාගමේ ආදායම් වර්ධනය කර ගැනීම සඳහා උපායමාර්ග හඳුනාගෙන අලෙවිකරණ සැලසුමක් සකස් කර නොතිබුණි. | ඉලක්කය කරා යාමට අපේක්ෂා කළ අතර ආර්ථික අර්බුදය, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත අඹතලේ වැලි විකුණුම් මධ්‍යස්ථාන වසා දැමීම, ඉන්ධන මිල හා ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල ඉහල යාම, වැලි විකුණුම් මධ්‍යස්ථාන අවට පුද්ගලික වැලි විකුණුම් මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර ලබා දීම, යනාදී හේතූන් මත අපේක්ෂිත වැලි විකුණුම් කටයුතු සිදු කිරීමට අපහසු විය. | ප්‍රායෝගික තත්වයන් සලකා බලා ආදායම් වර්ධනය කර ගැනීම සඳහා උපායමාර්ග අලෙවිකරණ සැලසුමක් සකස් කල යුතුය. |